# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. RAT/D/UCB/05/DID2/FA/2021 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022 මැයි 24 දින

සභාපති,

බලංගොඩ නගර සභාව.

**බලංගොඩ නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ජේ.සුනිල් ශාන්ත.

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට.

පිටපත :- පළාත් පාලන කොමසාරිස්, සබරගමුව පළාත් සභාව.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මගේ අංකය / எனது இல. / My No. } RAT/D/UCB/05/DID2/FA/2021 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2022 මැයි 24 දින

සභාපති,

බලංගොඩ නගර සභාව.

බලංගොඩ නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

බලංගොඩ නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට බලංගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) නියමිත දිනට පෙර වරිපනම් බදු නොගෙවීම මත 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු දඩමුදල් ගිණුම්ගත කර නොතිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ආදායම් ණයගැතියෝ හා සමුච්චිත අරමුදල රු.1,262,127 ක් අඩුවෙන් දැක්වුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන තුල ජංගම නොවන වගකීම් යටතේ ණය ප්‍රාග්ධනය ලෙස සභාව විසින් ලබාගත් දිගුකාලීන ණය ශේෂ රු.93,121,442 ක් දක්වා තිබුණ ද, එහි ඇතුලත් 2022 වර්ෂයේ දී ගෙවීමට ඇති ණය ප්‍රාග්ධන කොටස රු.6,499,491 ක් ජංගම වගකීමක් ලෙස වෙන්කර දක්වා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාලව 2022 වර්ෂයේ දී ගෙවන ලද රු.51,934 ක් වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත නොකිරීමෙන් මෙහෙයුම් වියදම් හා ණයහිමි ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(ඈ) 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ප්‍රකාරව 2021 වර්ෂයේදී වෙන්දේසි කළ උපකරණවල පිරිවැය රු. 271,763 ක් වත්කම් ගිණුම්වලින් ඉවත් කර නොතිබීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට තොග ශේෂය රු. 146,913 කින් හා ජංගම නොවන වත්කම් ශේෂය රු. 124,850 කින් වැඩියෙන් දැක්වුණි.

(ඉ) ස්ථාවර තැන්පතු සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු පොලී රු.129,774 ක් ගිණුම්ගත කර නොතිබීමෙන් වර්ෂයේ මෙහෙයුම් ආදායම හා ජංගම වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(ඊ) තොග ලෙජරය හා තොග ගබඩා පාලන ගිණුම අතර රු.1,605,502 ක වෙනසක් පැවතුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත.වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූෂසන්ධානයෙන්, ව්‍යාජ ලේඛන

සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) පනතේ 6 (i) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) පනතේ 6 (i) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,063,975 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.23,422,086 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2021 | | | | 2020 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල් කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල් කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 10,700,000 | 11,951,860 | **8,429,144** | **6,874,552** | 10,880,000 | 10,993,748 | 9,740,380 | 4,273,339 |
| කුලී | 38,729,000 | 29,003,597 | **31,208,785** | **1,551,806** | 32,570,000 | 24,861,412 | 24,144,205 | 1,687,091 |
| බලපත්‍ර ගාස්තු | 2,223,000 | 1,503,965 | **1,452,216** | - | 1,790,000 | 1,587,817 | 1,519,818 | - |
| වෙනත් ආදායම් | 45,396,000 | 40,081,030 | **37,466,728** | **1,732,636** | 38,070,000 | 50,543,628 | 40,943,791 | 477,471 |
| | 97,048,000 | 82,540,452 | 78,556,873 | 10,158,994 | 83,310,000 | 86,400,376 | 76,348,194 | 6,437,901 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී බලපත්‍ර ගාස්තු, වරිපනම් හා බදු, බදු කුලී ආදායම ,සේවා සඳහා ගාස්තු සහ වෙනත් ආදායම් යන ආදායම් විෂයයන්ගේ රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට **34, 21, 19, 18** කින් හා **18** කින් අඩු වී තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ වලට අදාළ හිඟ වරිපනම් හා බදු රු.**5,862,494** ක් **2022** මාර්තු **31** දින වන විටත් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණු අතර, ඊට අදාළ කාල විශ්ලේෂණයක් ද සකස් කර නොතිබුණි.

2.2.4 කුලී

-----

ඉම්පිරියල් ඉදිරිපිට කඩ කාමරවල බදු කුලිය වර්ෂ 05 කට වරක් සංශෝධනය කිරීමට සභාව කටයුතු කර නොතිබුණු අතර, ඒවා පවත්වාගෙන යන පුද්ගලයන් 14 දෙනා සමඟ ලිඛිතව ගිවිසුම්ගත වීමට ද කටයුතු කර නොතිබුණි. ඉන් කඩ කාමර 09 ක් සඳහා මාස 02 සිට මාස 47 දක්වා කාල සීමාවක් අයනොවී පැවතුණු හිඟ කුලී රු.171,250 ක් 2022 මාර්තු වන විටත් අයකර ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කාර්යසාධනය

----------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුව විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

තිරසර සංවර්ධන ඉලක්ක

------------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී තිබුණ ද සිය විෂයය පරයට අනුව ළඟාකර ගතයුතු තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන නොතිබීම හේතුවෙන් එම අරමුණු වලට අදාළ ඉලක්ක, පාදක දත්ත, ඉලක්ක ළඟාවිය යුතු සංදිස්ථානයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

(අ) සේවක පුරප්පාඩු

--------------------

(i) මහජන සෞඛ්‍ය පරික්ෂක තනතුරක්, පුස්තකාලයාධිපති තනතුරු 02 ක්, ආදායම් පරික්ෂක තනතුරු 03 ක්, රියදුරු තනතුරු 05 ක්, ඖෂධ සංයෝජක තනතුරක්, කාර්යාල කාර්ය සහායක තනතුරු 05 ක් හා වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරු 07 ක් යන තනතුරු වල පවතින පුරප්පාඩු 24 ක් පිරවීමට කටයුතු කර නොතිබීමෙන් අදාළ කාර්යය සහ කර්තව්‍යයන් කාර්යක්ෂමව ඉටුකිරීමට බාධා වී තිබුණි.

(ii) 2016 මාර්තු 15 දින DMS/D/0217 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය මගින් බලංගොඩ නගර සභාවේ ගිනි නිවීමේ ඒකකය සඳහා තනතුරු 20 ක් අනුමත කර තිබූ නමුත් එම තනතුරු සඳහා කාර්ය මණ්ඩලය බඳවාගෙන නොතිබීම හේතුවෙන් ගිනි නිවීමේ ඒකකය සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් විධිමත්ව ස්ථාපිත කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) සේවක ණය

2018 මැයි මස සිට සේවය හැරගිය සේවකයෙකුගෙන් අයවිය යුතු රු.76,114 ක සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) දීර්ඝ කාලයක සිට ඉදිරියට එන විවිධ අත්තිකාරම් රු.8,680,970 ක් සමාලෝචිත වර්ෂය තුළදී ද හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) එකතුව රු.807,973 ක් වූ පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල් සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කර නොතිබුණි.

### 3.4 වත්කම් කළමනාකරණය

#### 3.4.1 වත්කම් වල ආරක්ෂාව තහවුරු නොකිරීම

භෞතිකව සොයාගැනීම අපහසු සභාව සතු බවට ලේඛනවල පමණක් සඳහන් අක්කර 05 පර්චස් 35.44 ක් වූ හිස් ඉඩම් හඳුනාගෙන නිරවුල් කර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

#### 3.4.2 පවරා නොගත් වත්කම්

නගර සභා කාර්යාලය, සභාවේ ආයුර්වේදය, කියවීම් ශාලාව, මහජන ක්‍රීඩාපිටිය හා ප්‍රේක්ෂකාගාරය පිහිටි ඉඩම්වල ලිඛිත අයිතිය නගර සභාව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කටයුතු කර නොතිබුණි.

### 3.4.3 නිෂ්ක්‍රීය වත්කම්

අවශ්‍යතා හඳුනාගැනීමකින් හා නිසි තාක්ෂණික ඇගයීමකින් තොරව 2017 හා 2020 වර්ෂ වලදී මිලදී ගන්නා ලද රු. 355,950 ක් වටිනා විදුලි උපකරණ 2022 මාර්තු 31 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි.

### 3.4.4 වාහන උපයෝජනය

රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2020 ඔක්තෝබර් 02 දිනැති හා අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව ධාවන තත්ත්වයේ නොපවතින අලුත්වැඩියා කිරීම ඵලදායි නොවන වාහන 2020 දෙසැම්බර් 31 දිනට පෙර අපහරණය කිරීමට ද ධාවන තත්ත්වයේ නොපවතින අලුත්වැඩියා කිරීම ඵලදායි වන වාහන 2020 දෙසැම්බර් 31 දිනට පෙර අලුත්වැඩියා කිරීමට ද කටයුතු කළ යුතු වුවත්, සභාවට පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ රු.150,000 ක් වටිනා ට්‍රේලර් 02 ක් හා වටිනාකම හඳුනාගත නොහැකි වූ ජල බවුසරයක් හා ට්‍රේලර් තම්පැක්ටරයක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂය සඳහා අයවැය සම්මත කර ගැනීමට සභාව කටයුතු කර නොතිබීම නිසා සබරගමුව පළාත් ආණ්ඩුකාරවරයා විසින් නගර සභාවේ 2021 වර්ෂයේ කාර්ය කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා පුනරාවර්තන වියදම් දැරීමේ බලය පමණක් අංක 2211/57 දරන ගැසට් පත්‍රය මඟින් සභාවට ලබා දී තිබුණි. සභාවේ කටයුතුවල අඛණ්ඩ පැවැත්ම සඳහා කටයුතු කිරීම 255 වන අධිකාරිය නගර සභා ආඥා පනත ප්‍රකාරව සභාපතිවරයා ඇතුළු සභිකවරුන්ගේ අත් නොහැරිය හැකි වගකීමක්ව තිබිය දී අදාල තැනැත්තන් විසින් වගකීම් සහගතව කටයුතු නොකිරීම නිසා 2021 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් දැරීමට නීතිමය අධිකාරය නොමැති වීමෙන් වාර්ෂික අයවැය මඟින් වෙන්කර තිබූ රු.53,075,000 ක සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

(ii) ප්‍රාදේශීය සභා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම - 2021 වැඩසටහන යටතේ බලංගොඩ නගර සභාවට අයත් පොදු වෙළඳසැල අලුත්වැඩියා කිරීම සඳහා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් රු.9,634,891 ක ප්‍රතිපාදන අනුමත කර තිබූ අතර, තුරු උයන කලාපය සඳහා වන වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම හා ළමා උද්‍යානය අසළ ඇති පොදු වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා රු.7,845,160 ක ප්‍රතිපාදන අනුමත කර තිබුණි. එහෙත් සභාව තුළ මතුව ඇති තත්ත්වය හේතුවෙන් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ද අමාත්‍යාංශය විසින් තාවකාලිකව අත්හිටුවා තිබුණි.

ජේ. සුනිල් ශාන්ත.
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.